**13 ශ්‍රේණිය ආර්ථික විද්‍යාව 9 වන සතිය ජූනි 29 සිට ජූලි 03 දක්වා**

**නිපුණතා මට්ටම 10.4 - විදේශ ආයෝජනය රටක ආර්ථිකයට බලපාන ආකාරය විමසයි.**

**විදේශ ආයෝජනය -**

- රටක්,ආයතනයක් හෝ පුද්ගලයකු හෝ වෙනත් රටක මූල්‍ය වත්කම් මිළදී ගැනීම හෝ තම ව්‍යාපාර බිහි කිරීම සහ පවත්නා ව්‍යාපාරවල කොටස් වැඩි සංඛ්‍යාවක් මිළදී ගැනීම විදේශ ආයෝජනයයි.

විදේශ ආයෝජනය ප්‍රධාන කොටස් දෙකකි.

1.ඍජු විදේශ ආයෝජන

2.කළඹ විදේශ ආයෝජන

- ඍජු විදේශීය ආයෝජන යනු කිසියම් ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් විදේශීය රටක ඵලදායී මූර්ත වත්කම් අත්පත් කර ගැනීමයි.

<u>නිදසුන්</u>

කර්මාන්තශාලා,පතල්,ඉඩකඩම් ආදී වත්කම් විදේශීය ආයෝජකයන් අත්පත් කර ගැනීම.

- කිසියම් වර්ෂයක් විදේශ ඍජු ආයෝජන ඇස්තමේන්තු කිරීමේදී රට තුළට ගලා එන ප්‍රාග්ධන ප්‍රවාහයන් හා රටින් පිටතට ගලා යන ප්‍රාග්ධනය යන දෙකම සැලකිල්ලට ගැනේ.
- කළඹ විදේශ ආයෝජනය යන්නෙන් අදහස් වන්නේ මූල්‍ය ප්‍රතිලාභයන් අපේක්ෂාවෙන් විදේශීය ආයෝජකයින් වෙනත් රටක ව්‍යාපාරික සමාගම් කොටස්,පිළිණපත්,ණයකර,වානිජ පත්‍රිකා ආදී මූල්‍ය වෙළෙඳපොළ උපකරණ මිළදී ගැනීමයි.

- කළඹ විදේශ ආයෝජනවලදී ආයෝජකයන්ට විදේශ ව්‍යාපාරයන්ගේ කළමනාකාරීත්වය,හිමිකම හෝ පාලනය හෝ පිළිබඳ හිමිකමක් නොලැබෙනු ඇත.

<u>අභ්‍යාස</u>

1.විදේශීය ඍජු ආයෝජන පිළිබඳ මෑත කාලීන ප්‍රවණතා 3ක් ලියන්න.

2.ඍජු විදේශ ආයෝජනයේ හිතකර හා අහිතකර ප්‍රතිවිපාක පහ බැගින් ලියන්න.

3.කළඹ ආයෝජනයේ මෑත කාලීන ප්‍රවණතා 3ක් ලියන්න.